# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2390/23 – 2024 ජුනි මස 28 වැනි සිකුරාදා – 2024.06.28**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/03/2023/55.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

ජේ. ගාමිණී ජයවර්ධන මහතා, "තිළිණ" මාවත, කු/මල්වාන කනත්තේවැව.

සහ

නිසාකෝ ෆර්නිචර්, අංක 179, බොරැල්ල පාර, අතුරුගිරිය.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනුෂ නානායක්කාර වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, සීදූව, ලියනගේමුල්ල, H.P.T. ප්‍රධාන පාර, අංක 31/1 හි නීතිඥ සී.ඒ.එච්.එම්.විජේරත්න මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**මනුෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2024 ජුනි මස 20 වැනි දින,
කොළඹ දී ය.

---

මගේ අංකය: IR/COM/03/2023/55.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

ජේ. ගාමිණී ජයවර්ධන මහතා, "තිළිණ" මාවත, කු/මල්වාන කනත්තේවැව.

සහ

නිසාකෝ ෆර්නිචර්, අංක 179, බොරැල්ල පාර, අතුරුගිරිය.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ,**

" නිසාකෝ ෆර්නිචර් ආයතනයේ සේවය කළ ජේ. ගාමිණී ජයවර්ධන මහතාට 2014 ජනවාරි සිට 2018 ජුනි මාසය දක්වා කලයට වැටුප් පත්‍රිකාවේ සඳහන් 'Second Service Charge' මුදල ලබා ගැනීම සඳහා හිමිකමක් තිබේ ද යන්න සහ හිමිකමක් තිබේ නම් ඔහුට ලැබිය යුතු සහනයන් කවරේ ද යන්න පිළිබඳව වේ."

**එච්.කේ.කේ.ඒ. ජයසුන්දර**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2024 මැයි මස 16 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 06 - 0179